22/04/2025

අධ්‍යක්ෂක,

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,

යෝර්ක් වීදිය, කොළඹ 01,

ශ්‍රී ලංකාව.

<u>**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ගරු අමාත්‍ය ලාල් කාන්ත මහතා විසින් රුපියල් කෝටි 60 ක අයථා මූල්‍ය ගනුදෙනුවක් සිදු කළ බවට සමාජ මාධ්‍ය ඔස්සේ කරනු ලබන අසත්‍ය ප්‍රචාරණයක් සම්බන්ධයෙනි.**</u>

Facebook සමාජ මාධ්‍ය ජාලයේ ක්‍රියාත්මක වන "Top News Lk" නැමැති ෆේස්බුක් පිටුවෙහි අනුරාධ තෙන්නකෝන් නමැති පුද්ගලයෙකු වාණිජ වටිනාකමකින් යුත් ඉඩම් ඔප්පු නිරවුල් කිරීමේ කටයුත්තක් සඳහා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරගනිමින් ගරු අමාත්‍ය ලාල් කාන්ත මහතා රුපියල් කෝටි 60ක අයථා මූල්‍ය ගනුදෙනුවක් සිදු කළ බවට සඳහන් කරමින් කරන ලද වීඩියෝවක් පළ කොට ඇත.

එම පළ කිරීම තුළ වන පහත උපුටා ගැනීම ඔබගේ අවධානයට යොමු කර සිටිමි.

*"...මැතක දී ඉතාමත් වාණිජ වටිනාකමක් සහිත ඉඩමක ඉඩම් ඔප්පු සහ ඒ අදාල දේවල් නිරවුල් කිරීම සඳහා ඒ කියන සමහර රාජ්‍ය නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් එක්තරා හිමිනමකගේ මැදිහත් වීමෙන් මේ ලාල්කාන්ත අමාත්‍යවරයා අත යට ගනුදෙනුව විතරක් අයථා ගනුදෙනුව විතරක් කෝටි 60 ක් කියලා තමයි අපිට දැන ගන්න තිබෙන ආරංචි අනුව..."*

එමෙන්ම එකී පළකිරීම Top News Lk යූ ටියුබ් නාලිකාව, Top News Lk ෆේස් බුක් පිටුව ඇතුළු අනෙකුත් සමාජ ජාලා මාධ්‍ය ඔස්සේ ද සෘජුව සහ අන්‍යාකාරයෙන් මේ වන විට සංසරණය වෙමින් පවතී.එකී ප්‍රකාශයන් මඟින් ගරු අමාත්‍යවරයාගේ කීර්ති නාමයට මෙන්ම අමාත්‍යාංශයේ නිල ක්‍රියාවලියට දෝෂාරෝපණය කරමින් එහි අක්‍රමවත්භාවයක් පවතින බව හුවා දැක්වීමට සංවිධානාත්මකව උත්සාහ කර ඇති බව පෙනී යයි. මෙය අමාත්‍යාංශයේ සහ අමාත්‍යවරයාගේ ප්‍රතිරූපය සිතාමතා පලුදු කිරීමේ චේතනාවෙන් දියත් කරන ලද අසත්‍ය සහ ද්වේෂසහගත මඩ ප්‍රචාරයක් මෙන්ම සංවිධානාත්මක කුමන්ත්‍රණයක ප්‍රතිඵලයකි.

මෙවැනි අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමේ බරපතලකම සලකා බලා, මෙම සිදුවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා සෘජු හා විවෘත පරීක්ෂණයක් පවත්වා එහි සත්‍යතාවය අනාවරණය කර

ගැනීමේ අවශ්‍යතාවය අමාත්‍යවරයා සහ අමාත්‍යාංශය අවබෝධ කර ගත් හෙයින් ඉදිරියටත් මෙවැනි ක්‍රියාකාරිත්වයන්ට සහ කුමන්ත්‍රණයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවන් සළකා බැලීමට නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව පහත සබැඳීන් තුළ දක්වන ලද වීඩියෝ දර්ශන වල පෙනී සිටින්නා වූ අනුරාධ තෙන්නකෝන් යන අය විසින් සිදු කරනු ලැබූ ප්‍රකාශයන් සම්බන්ධයෙන් විවෘත විමර්ශනයක් සිදු කර එයින් අනාවරණය වන කරුණු මත පදනම්ව, යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය කටයුතු ඔබ විසින් සම්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

- Top News Lk නමැති යූ ටියුබ් නාලිකාවේ සබැඳිය : https://youtube.com/@topnewslk?si=rt9fX1hEeFnZ8r9m
- අදාළ යූ ටියුබ් නාලිකාවේ පළ කරන ලද වීඩියෝ සබැඳිය : https://youtu.be/VIyEkp7XJEo?si=omYRjzAM5b6XXuON
- Top News නමැති ෆේස්බුක් පිටුවේ සබැඳිය : https://www.facebook.com/topnewslk.comnews
- අදාළ ෆේස්බුක් පිටුවේ පළ කරන ලද වීඩියෝ සබැඳිය : https://www.facebook.com/share/v/laeKPwykjn/

මෙයට,
විශ්වාසී,

ආර්. එම්. පී. සංජීව බණ්ඩාර රාජනායක
මාධ්‍ය ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යාංශය
ජා. හැ. අංකය : 820341384V
දුරකථන අංකය : 0777298449